රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
அரச நிதித் திணைக்களம்
DEPARTMENT OF PUBLIC FINANCE
මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ-01, ශ්‍රී ලංකාව.
பொதுத் திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு-01, இலங்கை.
General Treasury, Ministry of Finance, Colombo-01, Sri Lanka.

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General — Tel. 94-11-2484614, Fax. 94-11-2436337
කාර්යාලය / அலுவலகம் / Office — Tel. 94-11-2484637, Fax. 94-11-2431458

Website: www.pfd.gov.lk  E-mail: pubfin@pfd.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: PFD/RED/ CIR/2016/02
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி: 2016.02.18

රාජ්‍ය මුදල් චක්‍රලේඛ ලිපි අංක : 03

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථාවල, ව්‍යාවස්ථාපිත මණ්ඩලවල හා රජයට අයත් සමාගම්වල සභාපතිවරුන්,
පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් හා ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන්
සහ මහ බැංකුවේ අධිපති වෙත

**<u>නැව් භාණ්ඩ ආනයනය කිරීම ලංකා නැව් සංස්ථා මණ්ඩලය (CSCL) සඳහා වෙන් කර දීම</u>**

උක්ත කරුණට අදාල වන 2005.05.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 415 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ.

1. භාණ්ඩ ආනයනය කිරීමේ කටයුතුවලදී රාජ්‍ය මුදල් චක්‍රලේඛ 415 හි විධිවිධාන අනුගමනය කළ යුතු බව 2016.01.13 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත. එබැවින්, නැව් මගින් භාණ්ඩ ආනයනය කරනු ලබන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා, විදේශ ආධාර ලබන ව්‍යාපෘති ඇතුළු ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම් වැනි සියළුම රජයේ ආයතන විසින් ඉහත රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන තරයේ අනුගමනය කරමින් නැව් මගින් භාණ්ඩ ආනයන කටයුතු සිදු කිරීම අනිවාර්යය වේ.

2. 2005.05.06 දිනැති අංක 415 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 7වන ඡේදය ප්‍රකාරව නැව් මගින් භාණ්ඩ ආනයනය කිරීමේ කටයුතු සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2005.05.06 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 415 හා ඒ සඳහා අදාල අනෙකුත් චක්‍රලේඛවල සඳහන් රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා සියළුම වාණිජ බැංකුවල දැඩි අවධානය යොමු කරවීමට නව උපදෙස් නිකුත් කරන ලෙස, මහ බැංකු අධිපතිවරයා වෙතින් මෙමගින් ඉල්ලා සිටිනු ලැබේ.

අත්. කළේ: පී. අල්ගම
රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: විගණකාධිපති